# රබර් නැවත වගා කිරීමේ සහනාධාර

යම වත්තක හෝ කුඩා ඉඩමක රබර් නැවත වගා කිරීම සඳහා රබර් පැළ නැවත වගා කිරීමේ අරමුදලින් සහනාධාර මුදලක් රබර් පාලක විසින් ගෙවනු ලැබේ. එම ආධාර මුදල් ලබාගැනීම සඳහා රබර් පාලක ගෙන් ඉල්ලීමක් කරන විට ඔහු විසින් කලින් කල ඒ සඳහා සපයනු ලබන පත්‍රිකාවෙහි එය කළ යුතුය.

1979 සැප්තැම්බර් 01 වන දින හෝ ඊට පසුව නිකුත් කරන ලද නැවත වගා කිරීමේ අවසර පත්‍ර අනුව, වත්තක රබර් නැවත වගා කිරීම සඳහා ගෙවිය යුතු සහනාධාර මුදල නැවත වගා කරනු ලබන බිම ප්‍රමාණයක් සම්බන්ධයෙන් එක් එක් අක්කරයකට රු. 5,000 ක් වේ. එහි මුදල පහත සඳහන් ආකාරයට ගෙවනු ලැබේ.

## අක්කර 100 කට අඩු වත්තකට සහනාධාර ගෙවන ක්‍රමය

(1) නැවත වගා කිරීමට ඇති බිම ප්‍රමාණය අක්කර 100 කට අඩු වත්තක් වන විට සහනාධාර මුදල වාර මුදල් හතකින් පහත සඳහන් ආකාරයට ගෙවනු ලැබේ.

(අ) රබර් ගස් සහ අනිකුත් වෘක්ෂලතාදිය මුලිනුදුරා දැමීමෙන් පසුව නැවත වගා කිරීමට ඇති එම බිම ප්‍රමාණයේ එක් එක් අක්කරයකට රු. 400 බැගින් වූ පළමුවන වාර මුදල ගෙවනු ලැබේ.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කළවිට එක් එක් අක්කරයට රු. 1000 බැගින් වූ දෙවන වාර මුදල ගෙවනු ලැබේ.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කොට අවුරුද්දක් ගතවන තෙක් අක්කරයකට රු. 1000 බැගින් වූ තුන්වන වාර මුදල නොගෙවනු ලැබේ.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කොට අවුරුදු දෙකක් ගතවන තෙක් අක්කරයට රු 700 බැගින් වූ හතරවන වාර මුදල නොගෙවනු ලැබේ.

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනක් ගත වීමට කලින් එක් එක් අක්කරයකට රු. 700 බැගින් වූ පස්වෙනි වාරමුදල නොගෙවනු ලැබේ.

(ඊ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 600 බැගින් වූ හයවන වාර මුදල නොගෙවනු ලැබේ.

(උ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු පහක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 600 බැගින් වූ හත්වන වාර මුදල නොගෙවනු ලැබේ.

## අක්කර 100 කට නොඅඩු විට ගෙවන ක්‍රමය

(2) නැවත වගා කිරීමට ඇති බිම ප්‍රමාණය අක්කර 100 කට නොඅඩු වත්තක කොටසක් වන අවස්ථාවකදී ආධාර මුදල වාරමුදල් හයකින් පහත සඳහන් ආකාරයට ගෙවනු ලැබේ.

(අ) රබර් ගස් සහ අනිකුත් වෘක්ෂලතාදිය මුලිනුදුරා දැමීමෙන් පසුව නැවත වගා කිරීමට ඇති ඒ කොටසේ එක් එක් අක්කරයකට පළමුවන වාර මුදල වශයෙන් රු. 400 බැගින් ගෙවනු ලැබේ.

(ආ) නැවත වගා කිරීම සම්පූර්ණ කළවිට එක් එක් අක්කරයකට රු. 1000 බැගින් වූ දෙවන වාර මුදල ගෙවනු ලැබේ.

(ඇ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 1000 බැගින්වූ තුන්වන වාර මුදල නොගෙවනු ලැබේ.

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 800 බැගින් වූ හතරවන වාර මුදල නොගෙවනු ලැබේ.

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 900 බැගින් වූ පස්වන වාර මුදල නොගෙවනු ලැබේ.

(ඊ) නැවත වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරක් ගතවීමට කලින් එක් එක් අක්කරයකට රු. 900 බැගින් වූ හයවන වාර මුදල නොගෙවනු ලැබේ.

## අක්කරයකට වඩා අඩු අවස්ථාවකදී ගෙවන ආකාරය

(3) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය අක්කරයකට වඩා අඩුවන අවස්ථාවකදී හෝ ඒ බිම් ප්‍රමාණයට අක්කරයකට වඩා අඩු බිම් කොටසක් ඇතුලත් වන අවස්ථාවකදී ගෙවිය යුතු සහනාධාර මුදල ගණන් බැලීමේදී එම බිම් ප්‍රමාණයට හෝ කොටසකට අදාල වන්නාවූ මෙම නියෝගයෙහි (1) වන සහ (2) වන ඡේද වල සඳහන් අනු ප්‍රමාණයන්, එම බිම් ප්‍රමාණය හෝ ප්‍රමාණයේ කොටස එක් අක්කරයකට දරන්නාවූ අනුපාතය අනුව ගෙවීම කරනු ලැබේ.

## සහනාධාර මුදල් ලබාගත් ඉඩම් පාලනය කිරීම

රබර් පාලක විසින් නිකුත් කරනු ලබන විධාන, නියමයන්, පරිසීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අනුකූලව ක්‍රියා කිරීම සහ නැවත වගා කළ බිම් ප්‍රමාණය යහපත් කෘෂිකාර්මික තත්වයකින් පවත්වා ගැනීම සහනාධාර මුදලේ පලමුවන වාර මුදල ලැබූ හැම කෙනෙකුගේම කාර්‍ය්‍ය විය යුතුය.

## සහනාධාර මුදල් ලබාගත් ඉඩම් විකිණීම

නැවත වගා කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරනලද බිම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර මුදලේ එක් වාර මුදලක් හෝ ඊට වැඩි ගණනක් තවදුරටත් ගෙවනු ලැබූ වත්තක හෝ කුඩා රබර් ඉඩමක අයිතිකරු විසින් රබර් පාලකගෙන් ලබාගත් ලිඛිත අනුමැතිය නොමැතිව, එම මුළු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතුය.

## සහනාධාර මුදල් ලබාගත් ඉඩම් වගා කරන ආකාරය

යම් බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට සහනාධාර මුදලේ පළමුවන වාර මුදල ගෙවනු ලැබූ අවස්ථාවකදී ඒ වාර මුදල ගෙවූ දින සිට අවුරුද්දක් ඇතුලත හෝ ඒ සඳහා රබර් පාලක විසින්

තව දුරටත් දෙනු ලැබිය හැකි ඒ කාලය ඇතුලත් ඒ තැනැත්තා විසින්

(අ) රබර් පාලක අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ග වලට අයත් රබර් පැල වලින් එම කොටස නැවත වගා කිරීම සම්පූර්ණ කළ යුතුය.

(ආ) ලිඛිත දැන්වීමකින් රබර් පාලක විසින් ඉල්ලා සිටිනු ලැබේ නම්, රබර් පැල සහ භූමි ආවරණ රනිල පැලෑටි හැර සියළු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් බැහැර කළ යුතුය.

(ඇ) රබර් පාලක විසින් ලිඛිත දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි පරිදි කාණු, ගල්වැටි ඒ කොටසේ තැනිය යුතුය.

(ඈ) රබර් පාලක විසින් ලිඛිත දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි පරිදි ඒ බිම් ප්‍රමාණයේ භූමි ආවරණ රනිල පැලෑටි සිටුවීම හෝ පස සෝදා පාළුවීම වැළැක්වීම සඳහා හෝ වෙනත් පියවර ගත යුතුය.

(ඉ) රබර් පාලක විසින් ලිඛිත දැන්වීමකින් ඉල්ලා සිටිනු ලැබේ නම් ඒ බිම් ප්‍රමාණය වටා වැටක් ඉදිකල යුතුය.

## වගාකරනු ලබන රබර් පැල ප්‍රමාණය

යම් බිම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාර මුදලක් හෝ ඉන් යම් කොටසක් ගෙවනු ලැබුවේ යම් තැනැත්තකුවද ඒ සෑම තැනැත්තකු විසින්ම එම බිම් ප්‍රමාණයේ එක් එක් අක්කරයක නැවත වගා කරන ලද අවම රබර් පැල සංඛ්‍යාව මෙසේ විය යුතුය.

(අ) නැවත වගා කිරීමට බඩ රබර් පැල යොදා ගන්නාවූ අවස්ථාවක නැවත වගා කරන වේලාවේදී පැල 180 ක්ද නැවත වගා කිරීම් සම්පූර්ණ කළ පසු පළමු වර්ෂය අවසානයේදී පැල 150 ක් සහ ඊළඟ අනුක්‍රමික අවුරුදු දෙක අවසානයේදී පැළ 140 ක් විය යුතුය.

(ආ) ක්ලෝන රබර් පැල බෙදා ගන්නාවූ අවස්ථාවක නැවත වගා කරන වේලාවේදී පැල 220 ක්ද, නැවත වගා කිරීම සම්පූර්ණ කළ පසු එළඹෙන පළමු වර්ෂය අවසානයේදී පැල 200 ක්ද, දෙවන වර්ෂය අවසානයේදී පැල 180 ක්ද, තුන්වන වර්ෂය අවසානයේදී පැල 180 ක්ද ඊළඟ අනුක්‍රමික වර්ෂ දෙක අවසානයේදී පැල 160 ක්ද විය යුතුය.

## රබර් පැලවල තබා ගතයුතු අවම වට ප්‍රමාණය

යම් බිම් ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් පැලවල පොළවේ සිට අඩි තුනක් උඩින් තිබිය යුතු අවම වටප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීමට සහනාධාර මුදලක් හෝ ඉන් යම් කොටසක් ගෙවනු ලැබූ සෑම තැනැත්තෙකුගේම කාර්‍ය විය යුතුය.

(අ) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය අඟල් 100 කට වැඩි දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන ලෙස විය යුතුය.

1. නැවත වගාකර ලීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේදී අඟල් 4
2. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේදී අඟල් 6 1/4
3. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේදී අඟල් 10
4. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේදී අඟල් 12½

(ආ) සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 100 කට අඩු දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත දැක්වෙන පරිදි විය යුතුය.

1. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේදී අඟල් 4
2. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේදී අඟල් 5½
3. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන සතරවන වර්ෂය අවසානයේදී අඟල් 9
4. නැවත වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේදී අඟල් 11

## කිරි කැපිය යුතු කාලය

යම් බිම් ප්‍රමාණයක නැවත වගා කරන ලද රබර් ගස් වලින් යටත් පිරිසෙයින් 60% ක් වත් පොළවේ සිට මැනීමේදී අඩි 3 ක් උසින් අවම වශයෙන් අඟල් 20 ක වටප්‍රමාණයක් දක්වා වැඩෙන තෙක් රබර් ගස්වල කිරි නොකැපීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහනාධාර මුදලක් හෝ ඉන් යම් කොටසක් ලබා ඇති සෑම තැනැත්තෙකුගේම කාර්‍ය විය යුතුය.

මේ ආකාරයට වැවිලි කර්මාන්ත ඇමතිවරයා විසින් සපයනු ලබන, ඉහත සඳහන් නියෝග සපුරාලන, රබර් වත්තක් හෝ කුඩා රබර් ඉඩමක් හිමි ඕනෑම කෙනෙකුට රබර් පාලක විසින් සහනාධාර මුදල් ගෙවනු ලැබේ.